# රිච්මන්ඩ් විද්‍යාලය Richmond College

## පළමු වාර පරීක්ෂණය - 2020
## First Term Test - 2020

| 11 | S | I,II |
|---|---|---|

**බුද්ධ ධර්මය I, II**
Buddhism **I, II**

**කාලය පැය තුනයි.**

**නම / අංකය : ......................................................................**

**10 ශ්‍රේණිය**

**I කොටස**

* **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
* **I කොටසේ එක් ප්‍රශ්නයක් සඳහා ලකුණක් බැගින් හිමිවේ.**

(01). පංච මහා විලෝකනයට අයත් නොවන්නේ,
i.දීපය ii.ජනපදය iii.කාලය iv මව

(02). සිදුහත් බෝසතුන් උපන් අවස්ථාවේ සිදුවූ විශේෂිත සිදුවීමක් වන්නේ,
i. සත් පියුම් පිපී පා පිළි ගැනීම
ii. නිබ්බුත පද කීම.
iii. මහා ප්‍රජාපතී ගෝතමිය කලුරිය කිරීම.
iv. දෙවිවරු සෝවාන් වීම.

(03). සිදුහත් බෝසතාණන් මනුලොවට වැඩීමට පෙර
i. බ්‍රහ්ම ලෝකයේ විසීය.
ii. තුසිත දෙව්ලොව ජීවත් විය.
iii. වෙස්සන්තර රජු ලෙස රජකම් කළේය.
iv. නිම්මානරතී නම් දෙව්ලොව විසීය.

(04). සුප්‍රබුද්ධ රජුගේ දියණිය ලෙස හැඳින්වනුයේ,
i. මයා කුමරියයි. ii. භද්දකච්චානා කුමරියයි.
iii.විශාකාවයි iv.උප්පලවන්නා කුමරියයි.

(05). ස්වයංවරය යනු විවාහය සඳහා කුමරියක,
i. දෙමාපිය කැමැත්ත මත තෝරා ගැනීමයි.
ii. මවගේ කැමැත්ත මත පමණක් තෝරා ගැනීමයි.
iii. ගුරුවරයාගේ කැමැත්ත මත තෝරා ගැනීමයි.
iv. තම කැමැත්ත මත තෝරා ගැනීමයි.

(06). සුදොවුන් රජුගේ අභිලාෂය වූයේ තම පුත් කුමරු
i. සක්විති රජවනු දකීමයි.
ii. බුදුවනු දැකීමයි.
iii. රහත්වනු දැකීමයි.
iv. සාර්ථක යුගදිවියක් ගත කරුණු දැකීමයි.

(07). සිදුහත් කුමාර දිවිය හා අදාල නොවන පිළිතුර තෝරන්න.
i. රම්‍ය, සුරම්‍ය, සුභ ii. ගිම්හාන, හේමන්ත, වස්සාන
iii.බුද්ධ, ධම්ම, සංඝ iv.මහාමායා, යශෝධරා, ප්‍රජාපතී

(08). බුදු දහමෙහි කම්සැප යන්නට සමීප අර්ථය සපයන අදහස නම්,
i. ඉන්ද්‍රියන්ට දැඩි දුක් දීමයි.
ii. මධ්‍යස්ථ දිවියක් ගත කිරීමයි.
iii. පාරලෞකිකත්වය අරමුණු කරගෙන ජීවත් වීමයි.
iv. ඉඳුරන් පිනවමින් ජීවත්වීමයි.

(09). සිදුහත් බෝසතුන් සතර පෙර නිමිති වලින් අනුගමනය කිරීමට කැමති වූයේ,
- i. මහල්ලෙකු ලෙසටය.
- ii. ලෙඩෙකු ලෙසටය.
- iii. මළ මිනියක් ලෙසටයි.
- iv. පැවිදිරුවක් ලෙසටය.

(10). රාහුලෝ ජාතෝ බන්ධනං ජාතං මෙහි නියම අදහස නම්.
- i. රාහුලයෙක් උපන්නා බැඳීමක් ඇති වුණා යන්නය.
- ii. රාහුලයෙක් උපන්නා පියකෙනෙක් වූයෙමි.
- iii. රාහුලයෙක් උපන්නා ගිහිගෙයින් යා නොහැක.
- iv. රාහුලයෙක් උපන්නා දායාදා ද සෙවිය යුතුය.

(11). නිබ්බුත පද හා අදාල ප්‍රකාශයන් තෝරන්න.
- i. මෙවන් පුතෙකු ලද මවක් පියෙක් නිවුනේ වෙති.
- ii. මෙවන් පුතෙකු ලද සුළු මව ද නිවුනේය.
- iii. මෙවන් පුතෙකු ඇති කුල පරම්පරාවම නිවුණේ වෙයි.
- iv. මෙවන් සැමියෙකු ඇති බිරිඳ නිවුනේ නොවෙයි.

(12). බුදු රජාණන් වහන්සේ ස්වකීය ශ්‍රාවකයන් හැඳින්වීමට භාවිතා කළ නාමය වනුයේ,
- i.භාමුදුරුවරු යන්නය.
- ii. භික්බු යන්නය.
- iii.සාධු යන්නය.
- iv ශ්‍රමණ යන්නයි.

(13). දැනට ලොව ඇති පැරණිතම පැවිදි සංවිධානය ලෙස සැලකෙන්නේ,
- i.ආජීවක යන්නය.
- ii. පරිබ්‍රාජිකාවන්ය.
- iii.ආචේලකයන්ය.
- iv.භික්ෂු සමාජයයි.

(14). අංගුලිමාල පිරිත දේශනා කරනු ලබන අවස්ථාව නම්,
- i.ගැබිනි මවුවරුන්ටය.
- ii. සියලු රෝග නිවාරණයටය.
- iii.මානසික රෝගීන්ටය.
- iv.වැසි ලබා ගැනීම සඳහාය.

(15). බුදු දහම අනුව ශ්‍රද්ධාව යන්නෙන් අදහස් කරනුයේ,
- i. චතුරාර්ය සත්‍ය පිළිබඳ විශ්වාසයයි.
- ii. තුනුරුවන් පිළිබඳ පවතින විශ්වාසය හා ගෞරවයයි.
- iii. සියලු දේ නැසෙන සුළුය සහ අවබෝධයයි.
- iv. නිර්වාණ අවබෝධයයි.

(16). භික්ෂුව ගිහියාට මෙත් සිතින් අනුකම්පා කොට අනු ශාසනා කිරීම හා වඩාත් ගැළපෙන පිළිතුර වනුයේ,
- i. දිව්‍ය මනුෂ්‍ය සැප උදාකර ගැනීමටය.
- ii. සතර අපායෙන් මිදීමටය.
- iii. නිවන පමණක් අරමුණු කරගෙනය.
- iv. මෙලොව හා පරලොව දියුණුව සඳහාය.

(17). පුද්ගලයා තුළ සංවර්ධනය කරගතයුතු ඉතා වැදගත් අංශයක් ලෙස අධ්‍යාත්මික දියුණුව දැක්විය හැකිය. මින් අදහස් කරනුයේ,
- i.සිතෙහි දියුණුවයි.
- ii. පරලොව දියුණුවයි.
- iii.සදාචාර සංවර්ධනයයි.
- Iv.ලෞකික දියුණුවයි.

(18). භික්ෂුව දායකයාගෙන් ප්‍රත්‍ය ලබා ගැනීමට අනුදැන වදාළ ක්‍රමය නම්,
- i. වේයකු තුඹසක් බඳාන ආකාරයටය.
- ii. දිඹුල් කන්නෙකු ලසෙටය.
- iii. බමරා මල නොතලා රොන් ගන්නා අයුරින්ය.
- iv. පිය කෙනෙක් දරුවකු දෙන දෙයක් ගන්නා අයුරින්ය.

(19). අදාළ පිළිතුරුවලින් සාවද්‍ය ප්‍රකාශය නම්

i.බුදුගුණ 9 ii. දහම් ගුණ 6

iii.සඟ ගුණ 9 iv.සූවිසි ගුණ 28 යි.

(20). මනා වූ පිළිවෙත් පුරන නිසා මහා සංඝ රත්නය

i.ඤාය පටිපන්නය. ii. සුපටිපන්නය

iii.උජුපටිපන්නය. iv.පුඤ්ඤක්ඛෙත්තය

(21). බුද්ධං සරණං සිරස දරාගෙන යන තුන් සරණේ කවියෙහි තෙවැනි පාදය නිවැරදි ලෙස සඳහන් වන්නේ,

i. සංඝං සරණං සිවුරු දරාගෙන
ii. සංඝං සරණං සිත පහදාගෙන
iii. සංඝං සරණං පින් පහදාගෙන
iv. සංඝං සරණං නිවන් පතාගෙන

(22). බුදුරදුන්ව පුදන ප්‍රධාන පූජාවිධි දෙක නම්,

i. දාන පූජාව හා ගිලම්පස පූජාවයි.
ii. ආමිස පූජාව හා ප්‍රතිපත්ති පූජාවයි.
iii. චතුමධුර පූජාව හා කිරිපිඬු පූජාවයි.
iv. චීවර පූජාව හා දැහැත් පූජාවයි.

(23). වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

i. ලෝභ, ද්වේශ, මෝහ යනු කුසල් සිත්ය.
ii. යහපතට යෙදූ සිත අපගේ මව්පියන්ටත් වඩා යහපතක් උදාකරයි.
iii. නොමඟට ගිය සිත සතුරෙකුටත් වඩා හානියක් නොකරයි.
iv. මෝහ යනු අකුසල සිතක් නොවන්නේය.

(24). පංච නීවරණ ධර්ම යටපත්කරන භාවනාව වන්නේ,

i.විදර්ශනා භාවනාවයි. ii. ත්‍රිලක්ෂණ භාවනාවයි.

iii.සමථ භාවනාවයි. iv.ප්‍රඥා භාවනාවයි.

(25). උඩඟුනොව මහණ යනුවෙන් තල්පතක තුන්වරක් ලියා එල්ලා තැබුවේ,

i.අනගාරික ධර්මපාලතුමා. ii. දුටුගැමුණු රජතුමා

iii.රේරුකානේ චන්ද විමල හිමි iv.වැලිවිට සරණංකර හිමි

(26). ගිහියා මිථ්‍යාවෙන් මුදවා සත්‍ය කරා යොමු කිරීමේ සමාජමය නායකත්වය පැවරී තිබෙන්නේ,

i.සංඝරත්නයට ය. ii. ගුරුවරුන්ටය.

iii.ප්‍රජා නායකයන්ටය. iv.දෙමාපියන්ටය.

(27). මාස හතරක කාලයක් භාවනා කළත් ඵලක් නොලබා බුදුරදුන්ගෙන් කමටහන් ලබා මගඵල අවබෝධකර ගත් සැරියුත් හිමිගේ ගෝල නම,

i.ආනන්ද භික්ෂුව ii. ස්වර්ණකාර භික්ෂුව

iii.අනුරුද්ධ භික්ෂුව iv.රාධ භික්ෂුව

(28). බෞද්ධයන්ගේ අවසාන අරමුණ වන්යේ,

i.බ්‍රහ්ම ලෝකයට යෑමයි. ii. නිවන් ලබා ගැනීමයි.

iii.ශක්‍ර පදවිය ලැබීමයි. iv.සසර යළි ඉපදීමයි.

(29). ඇත්ත ඇති සැටියෙන් දැකගැනීමේ නුවණ හැඳින්වනුයේ,

i.පඤ්ඤා යනුවෙනි. ii. සංඛාර යනුවෙනි.

iii.විජ්ජා යනුවෙනි. iv.සඤ්ඤා යනුවෙනි

(30). වැලිවිට සරණංකර හිමියන්ට සංඝරාජ පදවිය පිරිනමන ලද්දේ,

i. කීර්ති ශ්‍රී රජසිංහ රජතුමා විසිනි.
ii. දෙවන රාජසිංහ රජතුමා විසිනි.
iii. ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමා විසිනි.
iv. පළමුවන රාජසිංහ රජතුමා විසිනි.

(31). නිසම්මකාරී යන්න හා ගැළපෙන අදහස තෝරන්න.

i.දමනය වීම හා සංයත බව
ii. දැහැමින් ජීවත්වීම
iii.නුවනින් විමසා කටයුතු කිරීම.
iv.අවිචාරශීලී බව

(32). ශීලය යන කුමක්දැයි නිවැරදි විග්‍රහය නම්,

i. සිත කය හා වචනය සංවර කර ගැනීමයි.
ii. සිත සංමාධිගත කර ගැනීමයි.
iii. කාය සංවරයයි.
iv. කය හා වචනය සංවර කර ගැනීමයි.

(33). බෞද්ධ ශික්ෂාපද ක්‍රමයක් නොවන්නේ,

i. ආජීව අෂ්ටවක ශීලය
ii. ගේහසික ශීලය
iii. සූවිසි ශීලය
iv. සාමණේර ශීලය

(34). සිටුපුත්‍රයෙක්ව ඉපිද දුස්ශීලව ක්‍රියාකොට ඇඳිවතට පමණක් සීමා වූ බුද්ධ කාලයේ විසූ සිටු පුත්‍රයා නම්,

i. මහ ධන සිටුපුත්‍රයා
ii. යසකුල පුත්‍රයා
iii. අනේපිඩු සිටු පුත්‍රයා
iv. මසුරු සිටු පුත්‍රයා

(35). පුද්ගලයාගේ භෝග විනාශයට හේතුවන කරුණු ඇතුළත් සූත්‍රය නම් කරන්න.

i. මංගල සූත්‍රය
ii. වසල සූත්‍රය
iii.සිඟාලෝවාද සූත්‍රය
iv. රතන සූත්‍රය

(36). කීර්තිය හා අපකීර්තිය අයත්වන්නේ,

i. ආර්ය අෂ්ටාංගික මාර්ගයටය.
ii. පංච නීවරණ වලටය.
iii. චතුරාර්ය සත්‍යයටය.
iv. අටලෝදහමටය.

(37). කළ පව් සිහිවී ඌරෙකු මෙන් කෑ ගසා දුක්විඳ මරණින් පසු අපාගත වූ පුද්ගලයා,

i. දෙව්දත් තෙර
ii. අජාසත් රජු
iii. චුන්දසූකර
iv. චිංචා මානවිකාව

(38). නැටුම්, ගැයුම්, වැයුම් ආදියෙහි ලොල් බව

i. පිරිහීමේ ලක්ෂයකි.
ii. බෞද්ධයන්ට අදාළ නොවන්නේ
iii. සාමාන්‍ය ක්‍රියාවකි.
iv. ජීවිතයට අවශ්‍ය කරුණකි.

(39). එළාර රජුට පෙර මෙරට බලය අල්ලාගෙන සිටි දකුණු ඉන්දියානු ආක්‍රමණිකයන් වූයේ

i. දායීය පීයීය
ii. සොලීන්
iii. සේන සහ ගුත්තික
iv. පරරාජසිංහ

(40). මහා සෑයට පමණක් දෙවනි වන දුටුගැමුණු රජු ඉදිකළ අසිරිමත් ගොඩනැගිල්ල,

i. මහා විහාරය
ii. ලෝවා මහා ප්‍රාසාදය
iii. ඇම්බැක්ක දේවාලය
iv. අභයගිරි විහාරය

## II කොටස

* ප්‍රශ්නය සියල්ලටම පිළිතුරු සපයන්න.

(01). කෙටි පිළිතුරු සපයන්න.

1) නීවරණ යනු හඳුන්වන්.
2) සතිසම්පජඤ්ඤ යනු අර්ථ දක්වන්න
3) ලද දෙයින් අසතුටු වීමට අදාල පාලි වචනය ලියන්න.
4) සමථ භාවනාවට අදාළ කම්ස්ථාන කීයද?
5) සතර මහා භූත කොටස් නම් කරන්න.
6) සංඛාර ස්කන්ධය හඳුන්වන්න.
7) ත්‍රිලක්ෂණය නම් කරන්න.
8) වැලිවිට සරණංකර සංඝරාජ හිමිගේ ගිහිකළ නම කුමක්ද?
9) 'උතුම් වූ ශීලාදි ගුණ ධර්මයන් සම්පූර්ණ කිරීමද නොකොට තරුණයකු ලෙස තම හැකියාව යොදවා ධනය උපයා ගැනීමෙහිද නිරත නොවී කෙළිදෙලෙන් ජීවත් වන්නෝ දුන්නෙන් විදින ලද ඊතළය මෙන් වේගයෙන් ගොස් වනයේ වැටී දිරාපත්ව යන්නාක් මෙන්.....' ආදී වශයෙන් තේරුම දැක්වෙන ධම්මපද ගාථාව ලියා දක්වන්න.
10) ධම්ම ජීවී යනු පැහැදිළි කරන්න.

(02).

1) සිදුහත් බෝසතුන් මුහුණදුන් අභියෝග හතරක් දක්වන්න.
2) අභියෝග ජය ගැනීමට පුද්ගලයකු තුළ තිබිය යුතු ගුණාංග තුනක් සඳහන් කරන්න.
3) පාසල් ශිෂ්‍යයෙකු ලෙස ඔබට මුහුණදීමට නියමිත අභියෝගයක් දක්වා ඒය ජයගන්නා ආකාරය පැහැදිළි කරන්න.

(03).

1) 'දක්ඛිණෙයියො' යන්නෙහි අර්ථය දක්වන්න.
2) ශ්‍රද්ධාවේ ප්‍රධාන ප්‍රභේද දෙක නම් කරන්න.
3) ගමේ පන්සලේ ස්වාමීන් වහන්සේගෙන් ගමට හා දායකයන්ට වන සේවාව පිළිබඳ විග්‍රහයක් කරන්න.

(04).

1) භාවනාව යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිළි කරන්න.

2) පුද්ගල චරිත හය නම් කරන්න.

3) ථීන මිද්ධ නීවරණය හඳුන්වා පුද්ගල පරිහානියට ඒය බලපාන ආකාරය පැහැදිළි කරන්න.

(05). පහත සඳහන් මාතෘකාවලින් දෙකක් සඳහා කෙටි සටහන් ලියන්න.

1) වැලිවිට සරණංකර සංඝරාජ හිමි.

2) දුටු ගැමුණු රජතුමා

3) පංච නීවරණ ධර්ම